Airport & Aviation Services
(Sri Lanka) (Private) Limited
Bandaranaike International Airport, Colombo, Katunayake, Sri Lanka.

# මාධ්‍ය නිවේදනය

**2023 අප්‍රේල් 05 වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට පැමිණි ශ්‍රී ලාංකික මගියෙකුගේ ජංගම දුරකථනයක් සොරකම් කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් ජන මාධ්‍ය සහ වෙනත් සමාජ මාධ්‍ය ජාලා හරහා ප්‍රචාරය වන ප්‍රවෘත්තිය සම්බන්ධයෙනි.**

ශ්‍රී ලංකාවේ සියළු සිවිල් ගුවන් තොටුපළ ව්‍යවස්ථාපිත මෙහෙයුම්කරු වශයෙන්, ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රධාන මාධ්‍ය ආයතනයක් වන ඒබීසී මාධ්‍ය ජාලයට අයත් හිරු ටීවී (HIRU TV), සමාජ මාධ්‍ය ජාලා ඇතුළු අනෙකුත් ජන මාධ්‍යවල විකාශනය වන ඉහත සඳහන් වගකීම් විරහිත ප්‍රවෘත්තිය පිළිබඳව දැඩිව කණගාටු වන අතර කිසිදු අයුරකින් තහවුරු කර නොගත් තොරතුරු ඇසුරෙන් සාවද්‍ය තොරතුරු හරහා මහජනතාව නොමග යැවීම පිළිකුලෙන් යුතුව හෙළා දකින්නෙමු. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ ගුවන් ආරක්ෂක සේවා සීසීටීවී (CCTV) දර්ශන මෙම සිදුවීම සම්බන්ධයෙන් නැවත පරීක්ෂා කිරීමක් සිදු කළ අතර බණ්ඩාරනායක ජාත්‍යනතර ගුවන් තොටුපළේ දී මෙම සිදුවීම සිදු වූ බවට සනාථ කිරීමට සමත් කිසිදු සීසීටීවී (CCTV) දර්ශනයක සාක්ෂියක් සටහන් වී නොමැත. වීඩියෝ පටයේ සඳහන් කර ඇති ගුවන් මගියා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට (BIA) වෙත පැමිණීමට පෙර ගුවන් ගමන අතරතුරදී වෙනත් රටවල ගුවන් තොටුපළ වලදී සංක්‍රමණ (Transit) අවස්තා කිහිපයකට ගොස් ඇත.

එමෙන්ම ඉහත ජංගම දුරකථනය ගුවන් මගියාගේ ආගමනයේදී වෙනත් සංක්‍රමණික ගුවන් තොටුපළක ආරක්ෂක නිලධාරීන් විසින් රඳවා තබාගෙන ඇති බව අදාළ ගුවන් සමාගම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කළමනාකාරීත්වයට දන්වා ඇති අතර, එම ගුවන් තොටුපළ ආරක්ෂක නිලධාරීන් අදාළ පුද්ගලයාගේ ජංගම දුරකථනය සිය භාරයට ගැනීමට හේතු වී ඇත්තේ එම ගුවන් තොටුපළේ පවතින ආරක්ෂක නීති රෙගුලාසීන් මත බව අපවෙත එම ගුවන් සමාගම විසින් දැනුම් දී ඇත.

මෑත කාලීනව අප හට පෙනීයන්නේ විවිධ අවස්ථාවන්හිදී අප රට සහ ගුවන් තොටුපළ අපකීර්තියට පත්වන ආකාරයේ පදනම් විරහිත ප්‍රවෘත්තීන් රැසක් ජන මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා උපක්‍රමශීලීව සංසරණය කිරීමට සලස්වා ඇති බවය. ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපල මෙහෙයුම්කරු සහ ගුවන් සේවා සපයන්නා ලෙස ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම සහ සාමාන්‍ය ජනතාව නොමග යවමින් සහ ගුවන් තොටුපළ ප්‍රතිරූපයට දැඩි ලෙස හානි පමුණුවමින් පිළිගත් ප්‍රසිද්ධ ජන මාධ්‍ය නාලිකා ඔස්සේ ප්‍රචාරය කරන මෙවන් තහවුරු කර නොගත් සාවද්‍ය

Tel : +94 (11) 2252861 Fax : +94 (11) 2253187 , +94 (11) 2252239 (Supplies) Web : www.airport.lk

පුවත් දැඩි ලෙස හෙලා දකින අතර පවත්නා අභියෝග රැසක් මධ්‍යයේ වුවද ආරක්ෂාව තර කිරීමට සහ ගුවන් මගීන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම උදෙසා මහත් පරිශ්‍රමයක් ගන්නා මෙවන් වූ මොහොතක ගුවන් තොටුපළ පිළිබඳව සමාජගත කළාවූ මෙම ඍණාත්මක ප්‍රවෘත්ති පිළිබඳව අප මහත් කනගාටුවට පත් වන්නෙමු.

එමෙන්ම අප ගුවන් තොටුපළේ සිදු කෙරෙන්නාවූ වාර්ථා කල යුතු අගනා කාර්යන් රැසක් තිබියදී මෙවැනි වගකීම් විරහිත සාවද්‍ය ප්‍රවෘත්ති සඳහා ඉතා දැඩි අවධානයක් සහ ප්‍රමුඛතාවයක් ලබා දෙමින් විකාශය කිරීමට කටයුතු කිරීම ඉතා කණගාටුදායක තත්වයක් වන බවත්, විශේෂයෙන් ශ්‍රී ලංකාවට විදේශීය සංචාරකයන් පැමිණීම් වැඩි ප්‍රවණතාවයක් පවතින මෙවන් මොහොතක මෙවන් සාවද්‍ය ප්‍රවෘත්ති තුලින් සමාජගත කෙරෙන්නා වූ මෙම ඍණාත්මක ප්‍රචාරණය වගකිවයුතු මාධ්‍ය ආයතනයක් වශයෙන් නොකල යුත්තක් බව දැඩිව අප විශ්වාස කරන්නෙමු. මීට වැඩිමනත් වශයෙන් අප විසින් කරන ලද පැමිණිල්ලකට අනුව, ගුවන් තොටුපළ පොලීසිය මගින්ද මෙම කාරණාව සම්බන්ධයෙන් ඉතා දැඩි විමර්ශනයක් සිදුකරන අතර, මේ සම්බන්ධයෙන් රටටත් ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමට සහ ගුවන් සේවා සමාගමට සිදු කලාවූ අපකීර්තිය සම්බන්ධයෙන් මෙම ප්‍රකාශය සිදු කලාවූ ගුවන් මගියාට සහ කිසිදු කරුණු සනාථ කරගැනීමකින් තොරව මෙම සිදුවීම මාධ්‍යට නිකුත් කලාවූ ඉහත සඳහන් මාධ්‍ය ආයතනයට සහ මීට සම්බන්ධ සියළුම පාර්ශවයන්ට එරෙහිව අවශ්‍ය දැඩි නීතිමය පියවරයන්ද ඉදිරියේදී අප විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කරමින් පවතී.

මෙකී සිදුවීම හුදෙක් එක් සිදුවීමක් පමණක් වන අතර, පැය 24 පුරාවට ක්‍රියාත්මක වන ආයතනයක් වශයෙන් දිනක් තුළ අප වෙත වාර්ථා වන පැමිණිලි සියල්ලම පාහේ විමර්ශනය කර එම ගැටලු අප විසින් නිරාකරණය කරනු ලබන අතර එම විමර්ශනයන් තුළදී අපට තහවුරු වන්නේ මෙම සියළු බඩු බාහිරාදිය ගුවන් මගීන්ගේ වටිනා දෑ සහ මුදල් අස්ථානගතවීම් , සොරකම් කිරීම සහ අත්වැරදීමකින් වෙනත් අයෙකු රැගෙනයාම් සිදුවන්නේ ගුවන් මගීන්ගේම පවතින නොසැලකිලිමත් භාවය සහ ගුවන් ගමන අතරතුරදී ලබාදෙන්නාවූ ආරක්ෂක උපදෙස් නිසි අයුරින් පිළිනොපැදීම නිසා සිදුවන්නාවූ සිදුවීම් බවයි. එමෙන්ම විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණ වන්නේ, පසුගිය වසර 5ක කාලයක් පුරාවට කිසිම සොරකමක් සම්බන්ධයෙන් ගුවන් තොටුපළ කිසිදු සේවකයෙකු හට විනය නීතිමය පියවර ගැනීමක් හෝ කිසිදු එවන් චෝදනාවක්, පැමිණිල්ලක් යොමුවී නොමැත. එසේම දිනපතා ගුවන් මගීන්ගේ නොසැලකිලිමත් භාවය හේතුවෙන් ඔවුන් විසින් අස්ථානගත කරගන්නා වටිනා දෑ සහ මුදල් බොහෝ අවස්ථාවන්හිදී අප සේවක මඩුල්ල විසින් සොයා බලා නැවත භාරදුන් අවස්ථා ඉතා සුලබය. ඕනෑම මොහොතක ඒ පිළිබඳව සවිස්තරාත්මක සටහනක් අවශ්‍යතාවය මත පදනම්ව අප ගුවන් තොටුපළ ආරක්ෂක අංශයෙන් මෙන්ම ගුවන් තොටුපළ පොලීසියෙන් ලබා ගැනීමට හැකියාව ඇත.

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේදී පවතින දැඩි ආරක්ෂක වටපිටාව සහ සීසීටීවී කැමරා පද්ධතිය සහ පරීක්ෂන අනුව ගුවන් මගියෙකු ගේ කිසිදු අයිතමයක් ඔවුනගේ නොසැලකිලිමත් භාවය නොවන්නට මෙම ගුවන් තොටුපළ තුළදී නැතිවීමට හැකියාවක් කිසිසේත්ම නොමැති බවට අපට තහවුරු කළ හැක.

අප ගුවන් තොටුපළ හරහා ගමන් කරනු ලබන ඕනෑම මගියෙකුට යම් කිසි ගැටලුකාරී තත්වයක් ඇතිවුවහොත් ඒ සම්බන්ධව දැනුම් දීමට පැය 24 පුරා අප සමාගමේ වගකිවයුතු නිලධාරීන් සේවයේ

යොදවා ඇති අතර, එකී  ගැටලුව එම අදාළ නිලධාරීන්ට යොමු කිරීමෙන් අනතුරුව ඒ සඳහා සාධනීය විසඳුමක් ලබා දීමට අප සමාගම නිරතුරුව කටයුතු කරන්නෙමු.

ඉහත සඳහන් පරිදි වගකීම් විරහිත අසත්‍ය තොරතුරු ප්‍රචාරණය කිරීම සහ ඒවා මිතුරන් අතර බෙදා හදා ගැනීම තුළින් පාර්ශවයන් කිහිපයක් අගතියට පත්වේ. එවානම්,

1 ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම
2 එහි සේවය කරන සමස්ථ සේවක මඩුල්ල
3 ගුවන් සේවා කර්මාන්තය
4 සංචාරක කර්මාන්තය හා ඒ හා සබැඳි ආයතන
5 ශ්‍රී ලංකා රජය
6 ශ්‍රී ලංකාව සහ එහි වෙසෙන සමස්ථ ජනතාව

අවසාන වශයෙන්, සඳහන් කළ යුතු වන්නේ ගුවන් තොටුපළ ආශ්‍රිතව කිසියම් සිදුවීමක් ජනමාධ්‍ය හෝ සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ වාර්ථා කරන්නේ නම්, එම ප්‍රවෘත්ති පළ කිරීමට ප්‍රථම කරුණු සොයා බලා දැන තහවුරු කරගැනීමකින් අනතුරුව පළකරන ලෙසත්, මහජනතාවට වගකියන ප්‍රධාන පෙළේ ජනමාධ්‍ය ආයතන වශයෙන් මෙයට වඩා වගකීමෙන් යුතුව මෙවන් අවස්ථාවකදී කටයුතු කරන ලෙසත්, මෙවන් වූ මොහොතක මහජනයා මුලා කරමින් සාවද්‍ය තොරතුරු සමාජගත කිරීම සිදු නොකරන ලෙසටත් එවැනි පුවත් ගුවන් තොටුපළ සේවයේ නියුතු වගකිවයුතු බලධාරීන්ගෙන් කරුණු විමසා බැලීමකින් තොරව ප්‍රචාරණයට කටයුතු නොකරන ලෙසටත් මහජනතාවගෙන්ද ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වශයෙන් සියලුම ජනමාධ්‍ය ආයතන වලින් ඉතා කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

**මේජර ජනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී**
**සභාපති**
**ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**

**2023 අප්‍රියෙල් මස 10 වන දින**